ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ නායිකාවන් අතර සබඳතා ශක්තිමත් කෙරේ</u>

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා විසින් 2025 ජුනි 16 වන දින ඉන්දියා හවුස් හිදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් සඳහා ප්‍රිය සම්භාෂණයක් පවත්වන ලදී. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය සහ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිනිය මෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. වසර ගණනාවක් මුළුල්ලේ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ කාන්තාවන් විසින් දේශපාලන ක්ෂේත්‍රය තුළ ඉටු කරන භූමිකාව ඉස්මතු කළ මහ කොමසාරිස්තුමා මෙම කාරණයේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් නායකත්වය ගත් රටවල් දෙකක් බව සඳහන් කළේය. පසුගිය දශකය තුළ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ නායකත්වය යටතේ ඉන්දියාවේ කාන්තාවන් අක්‍රිය ප්‍රතිලාභීන්ගේ භූමිකාවේ සිට සක්‍රියව ජාතිය ගොඩනංවන් දක්වා පරිවර්තනය වී ඇති බව ද එතුමා ප්‍රකාශ කළේය. කාන්තාවන් සහ දරුවන් ඉන්දියාවේ ජනගහනයෙන් 67.7%කට දායකත්වය ලබා දෙන බැවින් නාරී ශක්ති හෙවත් කාන්තාවන්ගේ ශක්තිය ඉන්දියාවේ ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගෙන තිබේ. ඉන්දීය කාන්තාවෝ අභ්‍යවකාශ මෙහෙයුම් සිට බිම් මට්ටමේ පාලනය දක්වා රටෙහි අනාගතය හැඩගස්වමින් සිටිති.

3. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ මඟපෙන්වීම යටතේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සහ ඉන්දීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරමින් සිටියි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් විසි දෙදෙනා අතුරින් තිදෙනෙක් 2025 මැයි මස ඉන්දියාවේ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනයේ (PRIDE) පවත්වන ලද ප්‍රථම පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ වර්තමාන පාර්ලිමේන්තුව ඉතිහාසයේ වැඩිම මන්ත්‍රීවරියන් සංඛ්‍යාවක් සිටින පාර්ලිමේන්තුව වන බැවින් මෙම සහයෝගීතාවය ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සඳහා දැනට ක්‍රියාත්මක පාර්ලිමේන්තු මට්ටමේ හුවමාරු ඉහළ නංවාලීම සහ දෙරට අතර ආයතනික මනා භාවිතයන් පිළිබඳ ප්‍රවීණත්වය බෙදා හදා ගැනීම සඳහා මාහැඟි පිටිවහලක් වනු ඇත.

***

කොළඹ

*2025 ජූනි 17*